# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2000 අංක 2 දරන මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය, කාත්තන්කුඩි (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කලේ 2000 ජනවාරි මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 ජනවාරි මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

## 2000 අංක 2 දරන මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය, කාත්තන්කුඩි (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2000 ජනවාරි මස 12 වන දින.]

එල්. ඩී.– ඕ. 51/93.

**මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය, කාත්තන්කුඩි සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය, කාත්තන්කුඩි" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට අදාළ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කර ගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ කාත්තන්කුඩියේ මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මේ දක්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ ඒ සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2000 අංක 2 දරන මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය, කාත්තන්කුඩි (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මුස්ලිම් අරාබි විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාගත කිරීම.

**2.** (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) කාත්තන්කුඩි මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන්, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු, "මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය, කාත්තන්කුඩි" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර එකී නාමයෙන් එය විසින් ද එයට විරුද්ධ ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාගත කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) කාත්තන්කුඩිහි පිහිටි මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලය කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම ;

(ආ) ඉස්ලාමීය ආගමික අධ්‍යාපනය අරාබි භාෂා මාධ්‍යයෙන් ලබාදීම ;

(ඇ) ඉස්ලාමීය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සහ පුහුණු කිරීම සඳහා සැලසීම ;

(ඈ) ශුද්ධ වූ කුරානය මතකයේ තබා ගැනීම සඳහා ශිෂ්‍යයන් පුහුණු කිරීමේ පන්ති පැවැත්වීම ;

(ඉ) ඉස්ලාමීය ධර්මය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම ;

(ඊ) ඉස්ලාමීය ධර්මය පිළිබඳ අරාබි භාෂාවෙන් ලියූ පොත්පත් අඩංගු පුස්තකාලයක් පිහිටුවා ඊට අවශ්‍ය දෑ සපයා එය පවත්වාගෙන යාම ;

(උ) ඉස්ලාමීය ආගම පිළිබඳ පොත් සහ සඟරා පළ කිරීම ;

(ඌ) කාත්තන්කුඩි ප්‍රදේශයේ සහ ඒ අවට පදිංචි තරුණයන් සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්වීම ;

(එ) ඉස්ලාමීය ධර්මය අනෙකුත් භාෂාවලින් ප්‍රචාරය කිරීමට ඉවහල් වනු පිණිස ශිෂ්‍යයන්ට අනෙකුත් භාෂා ඉගැන්වීම ;

(ඒ) ඉස්ලාම් ධර්මය ප්‍රායෝගික ලෙස පිළිපැදීමට ධෛර්ය දීම ; සහ

(ඔ) සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් මුදුන් පමුණුවා ගැනීම සඳහා හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

## 2000 අංක 2 දරන මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය, කාත්තන්කුඩි (සංස්ථාගත කිරීමේ) පනත

3

4. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව තෝරාපත් කරගනු ලබන්නා වූ ද, ඒ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වූ ද අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින්, මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය විය යුතු ය.

5. (1) සංස්ථාවේ යම් මහ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කිරීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන වේලාවල්, ස්ථාන, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම්, ඒ රැස්වීම්වල න්‍යාය පත්‍ර, ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කරනු ලැබිය යුතු කරුණු ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ මුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වා ගෙන යාම සහ ඒවා විගණනය කිරීම ;

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කරගෙන යාම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන යම් රීතියක්, (1) වන උප වගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන්ම එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

6. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීමේ සහ ලබා ගැනීමේ ද දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඉන් කිසිවක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කාරණා සහ දේවල්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සිදු කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

7. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය සහ ශක්‍යතාව ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව ඒ සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ පැවැති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරන ලද සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතුව තිබුණු සියලු ණය, සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල් සහ දේපළ යෙදවීම.

9. කවර ආකාරයකින් වුව ද ලබාගත් සංස්ථාවේ ආදායම් සහ දේපළ හුදෙක් මෙහි දක්වා ඇති සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහාම පමණක් යෙදවිය යුතු අතර, ඉන් කිසිදු කොටසක් ලාභාංශ, ණය, ප්‍රසාද මුදල් හෝ ලාභ වශයෙන් සංස්ථාවේ සාමාජිකයන්ට කෙළින්ම නැතහොත් අන්‍යාකාරයකින් ගෙවීම හෝ මාරු කිරීම නොකළ යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන මගින් පහත දැක්වෙන දෑ තහනම් නොවන්නේ ය :—

(අ) සංස්ථාවේ යම් නිලධරයකු, සේවා නියුක්තයකු හෝ සේවකයකු නැතහොත් සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් සංස්ථාව සඳහා ඉටුකරන ලද සේවයක් වෙනුවෙන් යුක්ති සහගත සහ නිසි පාරිශ්‍රමික සද්භාවයෙන් ඔහුට ගෙවීම ;

(ආ) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු, කොටස් හිමියකු වන යම් සමාගමක් විසින් සංස්ථාවට කුලියට දෙන ලද යම් පරිශ්‍රයක් සඳහා යුක්ති සහගත සහ නිසි ගෙවල් කුලී ගෙවීම.

සංස්ථාවේ මුද්‍රාව.

10. සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති සාමාජිකයන් සංඛ්‍යාවක් ඉදිරියේ දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතුය. තව ද එවැනි අත්සන් කිරීමක්, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තන් විසින් කර ඇති අත්සනට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

11. යම් සාමාජිකයකුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල්වල ප්‍රමාණය ඉක්ම වූ කිසිදු මුදල් ප්‍රමාණයක් සංස්ථාවේ ණය හෝ බැරකම් පියවීම සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා සම්මාදම් වශයෙන් ගෙවීමට සංස්ථාවේ කිසිදු සාමාජිකයකු යටත් නොවිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

12. (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(ආ) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ සුදුසුකම්ලත් විගණකවරයා, යන්නෙන් —

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක්

අදහස් වේ.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන් කෙරෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ හැර ජනරජයේ, යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවූවිට එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.